**ශීර්ෂය 149 - කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යාවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යාවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 149 - කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 17 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

-----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාශයේ සිදුකරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.4 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 127 (1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතු වීම. | අනුකූල නොවීම. | 2.4 |
| 127 (2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්.<br>2. මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති. | 2.1.1(අ)<br>2.1.1(ආ) |
| 127 (4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරික්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල | වාර්ෂික කාර්යසාධන වාර්තා ඉදිරිපත් නොකිරීම. | 2.1.2 |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | | |
| 127 (5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේදී දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව. | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම.<br>2. අධි ප්‍රතිපාදන සලසා තිබීම. | 2.2(අ)<br>2.2(ආ) |
| 127 (6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරික්ෂණයකට භාජනය කිරීම. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු. | 2.3 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 2.1 කාර්යසාධනය

### 2.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

**(අ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය තුළදී අවසන් කිරීමට සැළසුම් කළ කර්මාන්තපුර 09 ක ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු.මිලියන 292.40 ක මුදලක් වැය කර තිබුණද අදාල කාර්යයන් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කිරීමට නොහැකිව තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ වැඩ අවසන් කළ යුතු ව්‍යාපෘති 02 ක් සඳහා රු.මිලියන 67.94 ක ප්‍රතිපාදන සලසා තිබුණද වර්ෂය තුළ කිසිඳු මුදලක් වැය කර නොතිබුණි.තවද මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

- කර්මාන්තපුරය ඉදිකිරීමට අදාල ඉඩම සම්බන්ධ පැහැදිලි එකඟතාවයකට එළඹ නොතිබියදී 2015 වර්ෂයේදි ගොඩනැගිලි ඉදිකිරීමට රු.මිලියන 34.5 ක් හා 2016 වර්ෂයේදී යටිතල පහසුකම් සඳහා රු.මිලියන 132.60 ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණු අතර 2017 වර්ෂයේදී ද ඉහත ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 67.94 ක් වෙන්කර තිබුණි.

- එමෙන්ම ව්‍යාපෘතිය සඳහා මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 253 ක් වූ අතර ව්‍යාපෘතියට අදාල ඉඩම සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් පැවතියදී 2017 දෙසැම්බර් 31 දින වන විට එයින් රු.මිලියන 167.1 ක් හෙවත් මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 66 කට ආසන්න මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි.

**(ආ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

කර්මාන්තපුර ඉදිකිරීමට අදාල ව්‍යාපෘති 03 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 9.54 ක වියදමක් දරා ඇති නමුත් ඊට අදාල කාර්යයන් ආරම්භ කර හෝ නොතිබුණි.

### 2.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 අගෝස්තු 17 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 2.2 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 2013 | පුනරාවර්තන | 596.89 | 566.42 | 30.47 | 5 |
| | මූලධන | 1,686.80 | 781.26 | 905.54 | 54 |
| | **එකතුව** | **2,283.69** | **1,347.68** | **936.01** | **41** |
| 2014 | පුනරාවර්තන | 739.78 | 714.94 | 24.84 | 3 |
| | මූලධන | 1,861.29 | 1,649.87 | 211.42 | 11 |
| | **එකතුව** | **2,601.07** | **2,364.81** | **236.26** | **9** |
| 2015 | පුනරාවර්තන | 1,804.16 | 1,691.16 | 113.00 | 6 |
| | මූලධන | 3,681.53 | 2,414.51 | 1,267.02 | 34 |
| | **එකතුව** | **5,485.69** | **4,105.66** | **1,380.02** | **25** |
| 2016 | පුනරාවර්තන | 1,970.17 | 1,773.48 | 196.69 | 10 |
| | මූලධන | 7,465.34 | 6,422.09 | 1,043.25 | 14 |
| | **එකතුව** | **9,435.51** | **8,195.57** | **1,239.94** | **13** |
| 2017 | පුනරාවර්තන | 2,419.58 | 1,971.68 | 447.90 | 19 |
| | මූලධන | 12,073.90 | 7,099.97 | 4,973.93 | 41 |
| | **එකතුව** | **14,493.48** | **9,071.65** | **5,421.83** | **37** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

මූලධන වැය විෂයයන් 07 ක් සඳහා රු.මිලියන 1,478 ක හා පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 340 ක ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී පැවතුණි.

### (ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම

පුනරාවර්තන වැය විෂයයන් 19 ක් සඳහා රු.මිලියන 52.1 ක් හා මූලධන වැය විෂයයන් 27 ක් සඳහා රු.මිලියන 2,422.7 ක් වශයෙන් එකතුව රු.මිලියන 2,474.8 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 31 සිට සියයට 98 අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ප්‍රතිපාදන සලසා ගැනීම**

මූලධන වැය විෂයයන් 03 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් සලසා ගෙන තිබූ රු.මිලියන 154.5 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

**2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 14901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 27 | 25.29 | 13 | 16.45 | 75 | 59.18 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 100,208 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 08 ක සිට පැවත එමින් තිබුණත් එම හිඟ හිටි ණය ශේෂ අය කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**2.4 අනුකූල නොවීම්**

**මුදල් රෙගුලාසිවලට අනුකූල නොවීම**

මුදල් රෙගුලාසි 103(1) (අ) ප්‍රකාරව හානිවීම් සම්බන්ධව විගණකාධිපති වෙත දැක්විය යුතු වුවත් 2017 වර්ෂය තුළ විගණනයට නිරීක්ෂණය වූ වාහන අනතුරු 15 ක් සම්බන්ධයෙන් එසේ දැනුවත් කර නොතිබුණි.

**2.5 මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

**අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

**--------------------------------------------------------------------------------**

අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 345.23 ක් වැය කර තිබුණි.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 72 | 51 | 21 |
| (ii) තෘතීයික මට්ටම | 07 | 06 | 01 |
| (iii) ද්වීතීයක මට්ටම | 680 | 545 | 135 |
| (iv) ප්‍රාථමික මට්ටම | 134 | 116 | 18 |
| (v) අනියම්/ කොන්ත්‍රාත්/අනෙකුත් | 01 | 01 | - |
| | 894 | 719 | 175 |